# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා අන්තර් පළාත් මගී ප්‍රවාහනයට මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම

## (ටෙන්ඩර් අංක 26)

දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි කරන ලද මගී සමීක්ෂණයන් අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවාවන් සඳහා නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මිල ගණන් කැඳවනු ලැබේ. පහත සඳහන් ලේඛණයේ විස්තර කර ඇති මාර්ගයන් සඳහා එම මාර්ගයන්ට සමගාමීව ඇති මාර්ගයක (බලපෑමක් ඇති වන මාර්ගයක ) වලංගු මගී සේවා අවසර පත්‍රයක් හිමි ධාවකයින්ට පමණක් ඉල්ලුම් කළ හැකි වේ.

| අනු අංකය | මාර්ග අංකය | මාර්ගය | | අවසරපත්‍ර ගණන | හරහා | සේවා වර්ගය | තනි පැත්තට ගාස්තුව | දිනකට බස්රථයක් ධාවනය කරන ගමන්වාර සංඛ්‍යාව | තාක්ෂණික අගය මත ගාස්තුව රු. | සමගාමී (බලපෑමක් ඇතිවන ) මාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගමන ආරම්භය | ගමනාන්තය | | | | | | | |
| 01 | EX 1 - 5/26 | හක්මණ | කොළඹ බැස්ටියන් මාවත | 01 | තිහගොඩ, මාතර, ගොඩගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව, හයිලෙවල් පාර | අධි සුඛෝපභෝගී | රු:610/= | 02 | 1,581,120.00 | |
| 02 | EX 1 - 7/26 | මිද්දෙණිය | කොළඹ බැස්ටියන් මාවත | 01 | තිහගොඩ මාතර, ගොඩගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව, හයිලෙවල් පාර | අධි සුඛෝපභෝගී | රු:720/= | 02 | 1,866,240.00 | 1. කොළඹ සිට ගාලු පාර ඔස්සේ දකුණු පළාතට හෝ කොළඹ සිට ගාලු පාර ඔස්සේ දකුණු පළාත හරහා වෙනත් පළාත් වෙත ධාවනය වන සේවාවන්<br>2. දකුණු පළාතේ සිට හෝ වෙනත් පළාතක සිට දකුණු පළාත හරහා කොළඹ දක්වා ගාලු පාර ඔස්සේ ධාවනය වන සේවාවන් |
| 03 | EX 1 - 9/493 | ඇඹිළිපිටිය | කොළඹ බැස්ටියන් මාවත | 01 | රන්න,බෙලිඅත්ත , මාතර ,ගොඩගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව,හයි ලෙවල් පාර | අධි සුඛෝපභෝගී | රු:800/= | 02 | 2,073,600.00 | |
| 04 | EX 1 - 10/60 | අකුරැස්ස | කොළඹ බැස්ටියන් මාවත | 01 | හයිලෙවල් පාර, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය, ඉමදූව | අධි සුඛෝපභෝගී | රු:520/= | 02 | 1,347,840.00 | |
| 05 | EX 1 – 11/32 | වීරකැටිය | කොළඹ බැස්ටියන් මාවත | 01 | හයිලෙවල් පාර, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය , ගොඩගම, මාතර , බෙලිඅත්ත | අධි සුඛෝපභෝගී | රු:690/= | 02 | 1,788,480.00 | |
| 06 | EX 1 – 12/32 | කතරගම | කොළඹ බැස්ටියන් මාවත | 03 | හයිලෙවල් පාර, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය , ගොඩගම, මාතර , මහවෙල | අධි සුඛෝපභෝගී | රු:910/= | 02 | 2,358,720.00 | |
| | | කොළඹ බැස්ටියන් මාවත | කතරගම | 01 | | | | | | |
| 07 | EX 1 – 14/60 | දෙණියාය | කොළඹ බැස්ටියන් මාවත | 01 | රාජගිරිය, බත්තරමුල්ල, පන්නිපිටිය, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉමදූව | අධි සුඛෝපභෝගී | රු:650/= | 02 | 1,684,800.00 | |
| 08 | EX 1 – 16 | ඇල්පිටිය | කොළඹ බැස්ටියන් මාවත | 01 | හයිලෙවල් පාර, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය , කුරුඳුගහ හැතැප්ම | අධි සුඛෝපභෝගී | රු.350/= | 02 | 907,200.00 | |
| 09 | EX 1 – 18 | කොළඹ බැස්ටියන් මාවත | මාතර | 02 | රාජගිරිය ,පන්නිපිටිය, කොට්ටාව, දක්ෂිණ අධිවේගී මාර්ගය , ගොඩගම | අධි සුඛෝපභෝගී | රු:530/= | 2 | 1,373,760.00 | |
| | | මාතර | කොළඹ බැස්ටියන් මාවත | 10 | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | EX 1 – 21 | කඩවත | ගාල්ල | 01 | පිටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, පින්නදූව | අධි සුඛෝපභෝගී | රු:440/= | 04 | 2,280,960.00 | |
| | | ගාල්ල | කඩවත | 02 | | | | | | |
| 11 | EX 1 – 22 | කඩවත | මාතර | 01 | පිටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, ගොඩගම | අධි සුඛෝපභෝගී | රු.540/= | 02 | 1,399,680.00 | |
| | | මාතර | කඩවත | 05 | | | | | | |
| 12 | EX 1 – 23 | කඩුවෙල | ගාල්ල | 02 | පිටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, පින්නදූව | අධි සුඛෝපභෝගී | රු:430/= | 04 | 2,229,120.00 | |
| | | ගාල්ල | කඩුවෙල | 04 | | | | | | |
| 13 | EX 1 – 25/450 | පානදුර | මාතර | 01 | ගැලණිගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, ගොඩගම | අධි සුඛෝපභෝගී | රු:470/= | 04 | 2,436,480.00 | |
| | | මාතර | පානදුර | 03 | | | | | | |
| 14 | EX 1 – 29/353 | කඹුරුපිටිය | කොළඹ බැස්ටියන් මාවත | 01 | තිහගොඩ, මාතර, ගොඩගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව, හයිලෙවල් පාර | අධි සුඛෝපභෝගී | රු:590/= | 02 | 1,529,280.00 | |
| 15 | EX 1 – 41 | අම්බලන් ගොඩ | කොළඹ බැස්ටියන් මාවත | 01 | කුරුඳුගහ හැතැප්ම, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව, පන්නිපිටිය, බත්තරමුල්ල, රාජගිරිය | අධි සුඛෝපභෝගී | රු:370/= | 02 | 959,040.00 | |
| | | කොළඹ බැස්ටියන් මාවත | අම්බලන් ගොඩ | 01 | | | | | | |
| 16 | EX 1-24/01 | මහනුවර | මාතර | 01 | නිට්ටඹුව, කඩවත, පිටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, ගොඩගම | අධි සුඛෝපභෝගී | රු.830/= | 02 | 2,151,360.00 | 1. මහනුවර - කොළඹ, කොළඹ - මහනුවර ධාවනය වන සේවාවන් 2. මහනුවර, කොළඹ සිට ගාලු පාර ඔස්සේ දකුණු පළාතට හෝ කොළඹ සිට ගාලු පාර ඔස්සේ දකුණු පළාත හරහා වෙනත් පළාත් වෙත ධාවනය වන සේවාවන් 3. දකුණු පළාතේ සිට හෝ වෙනත් පළාතක සිට දකුණු පළාත හරහා කොළඹ, මහනුවර දක්වා ගාලු පාර ඔස්සේ ධාවනය වන සේවාවන් |
| 17 | EX 1 - 6/270 | මාතර | මීගමුව | 01 | ගොඩගම, දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටරවුම් අධිවේගී මාර්ගය, කඩවත, ගම්පහ, මිනුවන්ගොඩ, කටුනායක | අධි සුඛෝපභෝගී | රු:670/= | 02 | 1,736,640.00 | 1. කටුනායක, මිගමුව, ගම්පහ සිට ගාලු පාර ඔස්සේ දකුණු පළාතට හෝ දකුණු පළාත හරහා වෙනත් පළාතකට ධාවනය වන සේවාවන් 2. දකුණු පළාතේ සිට හෝ වෙනත් පළාතක සිට දකුණු පළාත හරහා කටුනායක, මිගමුව, ගම්පහ දක්වා ගාලු පාර ඔස්සේ ධාවනය වන සේවාවන් |
| | | මීගමුව | මාතර | 01 | | | | | | |

සියලු අයදුම්කරුවන් පහත සඳහන් සියළුම කොන්දේසිවලට යටත්ව අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුවේ.

- එක් එක් මාර්ග සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
- එක් ඉල්ලුම්කරුවෙකුට අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැක්කේ මාර්ග තුනකට පමණි.
- එක් මාර්ගයක් සඳහා එක් ඉල්ලුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණි.
- සමාගමක් හෝ ව්‍යාපාරයක් ටෙන්ඩර් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී , එහි අධ්‍යක්ෂකවරුන්ට හෝ හවුල් කරුවන්ට වෙනම ටෙන්ඩර් අයදුම් පත්‍ර එම මාර්ගය සඳහා ඉදිරිපත් කළ නොහැක. එමෙන්ම

සමාගමක් හෝ ව්‍යාපාරයක් ටෙන්ඩර් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී එකම අධ්‍යක්ෂවරුන් හෝ හවුල්කරුවන් ඇති විවිධ සමාගම් හෝ ව්‍යාපාර වලටද වෙනම ටෙන්ඩර් අයදුම් පත්‍ර අදාල මාර්ග සඳහා ඉදිරිපත් කළ නොහැකිය.

- දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි බස් රථ ධාවනය සඳහා දැනටමත් මගීසේවා අවසර පත්‍ර හිමි ධාවකයින්ට මෙම මාර්ග සඳහා ඉල්ලුම්කල නොහැක.
- සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.
- දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා එක් ඉල්ලුම්කරුවෙකුට එක් මගී සේවා අවසර පත්‍රයක් පමණක් නිකුත් කරනු ලැබේ.
- නව මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීමත් සමඟ දැනට එම මාර්ගවල ධාවනය සඳහා නිකුත් කර ඇති මගීසේවා අවසර පත්‍ර / තාවකාලික මගීසේවා අවසර පත්‍ර අවලංගුවේ.
- එක් මාර්ගයකට වඩා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තේරී පත් වූ අවස්ථාවක තාක්ෂණික අගයට වඩා ඉහළම ප්‍රතිශතය සහිත ලංසුව ඉදිරිපත් කර ඇති මාර්ගයට මගීසේවා අවසර පත්‍රය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේය.
- මෙම ටෙන්ඩරය මගින් නිකුත්කරනු ලබන අවසර පත්‍ර කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එක් අවුරුද්දකට නොඅඩු වූද, අවුරුදු 03කට නොවැඩි වූද , එම අවසර පත්‍රයෙහි සඳහන් යම් කාලයක් සඳහා බලාත්මක විය යුතුය. එම කාලය තුල සපයනු ලැබූ සේවාව පිළිබඳව ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවසරපත්‍ර හිමිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අවසර පත්‍රයේ කාලය ඉකුත්වන දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුද්දකට නොඅඩු හා අවුරුදු 03කට නොවැඩි කාලයක් සඳහා අලුත් කළ හැකිය. (ජාගකොස පනතේ 25වන හා 30වන වගන්ති අනුව)
- බස්රථවල ආසන වෙන්කිරීමේ කටයුතු ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් පමණක් සිදුකරනු ලබන අතර මීට පටහැනිව කටයුතු කරන බස් හිමියන්ගේ මගීසේවා අවසර පත්‍රය අවලංගු කරනු ලැබේ.

**සැ.යු.: මෙයට අදාලව යම් අධිකරණයක නඩු කටයුත්තක් පවතීනම් එකී නඩුවට අගතියක් නොවන පරිදි මෙම ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබේ.**

ඉහත සේවාවන්ට අදාල කාල සටහන්, ගාස්තු සටහන් සහ බස් රථයේ පිරිවිතර මාලාව ඇතුළු සියලු විස්තර ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයට අමුණා ඇත. මෙම මාර්ග සඳහා වන ටෙන්ඩර් ඉල්ලුම් පත් **කොළඹ 05, උද්‍යාන පාරේ, අංක 241 හි පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාවට**, එක් ඉල්ලුම් පත්‍රයක් සඳහා රු.**3000/=** ක මුදලක් ගෙවීමෙන් ලබා ගත හැකිය.

**2018.05.04** දින සිට **2018.05.23** දින දක්වා (දෙදිනම ඇතුළුව) සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 09.00** සිට **ප.ව. 03.00** දක්වා ටෙන්ඩර් ඉල්ලුම්පත් නිකුත් කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරන ඉල්ලුම් පත්‍ර පමණක් ටෙන්ඩර් ඉල්ලුම් කිරීම සඳහා වලංගු වේ.

ඉල්ලුම්කරු ඇප මුදල් වශයෙන් රු.**200,000.00** ක මුදලක් තැන්පත් කළයුතු අතර, ඉල්ලුම් ඇප මුදල් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගිණුමට බැර කර ලබාගත් කුවිතාන්සිය **2018.05.24** දින **පෙ.ව. 9.30** ට **පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුදල් අයකැමි වෙත ඉදිරිපත් කර ලදුපතක් ලබා ගත යුතු වේ. එම ලදුපත ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය සමඟ පළමු ලියුම්කවරයට බහාලිය යුතුයි.**

ටෙන්ඩරයට අදාල අයදුම් පත්‍ර භාර ගැනීම **2018.05.24 වැනි දින පෙ.ව.10.00** ට අවසන් කරනු ලබන අතර, නියමිත කාලය ඉකුත් වූ වහාම ටෙන්ඩර් ඉල්ලුම්පත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ශ්‍රවනාගාරයේදී විවෘත කරනු ලැබේ. අවශ්‍ය සියලු විස්තර ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැමිණ හෝ **දුරකථන අංක 011-2553144** ඇමතීමෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් පිරිනැමීමේ හෝ **අවලංගු කිරීමේ** සම්පූර්ණ අයිතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුවන අතර, ටෙන්ඩර් අයදුම්කරුවන්ට දැරීමට සිදුවන වියදම් පිළිබඳව කොමිෂන් සභාව වගකීම භාරගනු නොලැබේ.

සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
උද්‍යාන පාර,
කොළඹ 05.